දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය විසින් ඒ සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතු යැයි Ethics Eye අපි දිගින් දිගටම පෙන්වා දෙන්නේ, අප්‍රවේසම්කාරී දිවි තොර කරගැනීම් වාර්තාකරණයන් ඔස්සේ, අනුකාරක දිවි තොර කරගැනීම් දිගින් දිගටම සිදුවීමේ හැකියාවක් ඇති බැවිනි.

වවුනියාවේ රන් භාණ්ඩ අලෙවි සැලක සේවය කළ ඉන්දීය ජාතිකයෙකු මැයි 27, 2022 දින දිවි තොර කරගත් බව ඇතැම් මාධ්‍ය විසින් වාර්තා කර ඇති ආකාරය, එවන් අප්‍රවේසම්කාරී දිවි තොර කරගැනීම් වාර්තාකරණයන්ට උදාහරණ ලෙස දැක්විය හැක.

1) එහිදී දිවි තොර කරගත් ආකාරය පළ කර තිබූ අතර, දිවි තොර කරගත් ආකාරය දීර්ඝ ලෙස විස්තර කොට ඇත.

2) දිවි තොර කරගත් ස්ථානය හා එහි ඡායාරූප සහ CCTV වීඩියෝ දසුන් ඔස්සේ පළ කර ඇත.

3) උපකාරක අංක සඳහන් කර නොමැත.

දිවි තොර කරගත් ආකාරය පළ කිරීම සහ ඒ පිළිබඳව දීර්ඝ ලෙස විස්තර කිරීම ඔස්සේ, එම ක්‍රමය අනුගමනය කරමින් සිදුවන අනුකාරක දිවි තොර කරගැනීම් පැතිර යෑමට හැකියාවක් තිබේ. එසේම, දිවි තොර කරගත් ස්ථානය මෙලෙසින් වීඩියෝ දර්ශන ඔස්සේ ද පෙන්වීම තුළින්ද අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා දායකත්වයක් ලැබෙනු ඇත.
හදිසි උපකාරක අංක මෙවැනි පුවත් සමගින් ඉදිරිපත් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවෙන් යුතු තවත් අයෙකුගේ ජීවිතය රැක ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

එසේ නම්, ඔබ සිතනා ලෙසට මෙම පුවත, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම් පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට වඩාත් අනුකූල වන ලෙසින් වාර්තා කිරීමේ හැකියාවක් නොතිබුණි ද?

(මෙම පුවත එදින අදාළ පුවත්පතේ සහෝදර ඉංග්‍රීසි පුවත්පතේ පළ වී නොතිබුණි.)

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Guidance_for_reporting...